# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1823/16 – 2013 අගෝස්තු 13 වැනි අඟහරුවාදා – 2013.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2011 අංක 287 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/97/ඊ/162.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: වඩ/එස්ඩබ්ලිව්/ඉඩම්/ඒසීකිව්/10.

1972 අංක 18 සහ 1974 අංක 29 දරන අර්ථ නිරූපන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත අර්ථ නිරූපන ආඥාපනතේ (12 වන අධිකාරය) 18 වැනි වගන්තියට අනුකූලව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම අංක 1738/10 හා 2011.12.28 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) ආඥාව යටතේ 2011 අංක 287 දරන ආඥාව මෙයින් අවලංගු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 26 වැනි දින,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 884

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2013 අංක 257 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/97/ඊ/162.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: වඩ/එස්ඩබ්ලිව්/ඉඩම්/ඒසීකිව්/10.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 26 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1A – G 18085 – 320 (2013/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, කරවෙඩ්ඩි.

2. **ඉඩමේ විස්තරය.**– යාපනය දිස්ත්‍රික්කයේ, වඩමාරච්චි දකුණ සහ බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අල්වායි දකුණ සුළු කොට්ඨාසයේ, කරවෙඩ්ඩි උතුර ගමේ පිහිටි, යාපනය දිස්ත්‍රික් මැණුම් අධිකාරි විසින් 1998.10.01 දිනැතිව පිළියෙල කරන ලද පි. පි. යා. 1910 දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.2532ක් පමණ වූ පාලවිරුක්කයි ඉඩමේ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

උතුරට: ප්‍රජා ශාලාව සහ පාර; නැගෙනහිරට: පාර; දකුණට: රාජේශ්වරී පුලෙන්තිරන් හිමිකම් කියන පාලවිරුක්කයි ඉඩම; බටහිරට: රාජේශ්වරී තුලෙයිරාජා හිමිකම් කියන පාලවිරුක්කයි ඉඩම සහ ප්‍රජා ශාලාව.

08 - 885

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2013 අංක 244 දරන ආඥාව

මගේ යොමු අංකය: 4/3/9/2011/ඩබ්එස්/212.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: වීඑස්ඩබ්/ඩීඑස්/ඉඩම්/ඩබ්එස්/2011.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, සන්දිලිපායි.

2. **ඉඩමේ විස්තරය.**– උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ, සන්දිලිපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මනිපායි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ (ජේ/140), මනිපායි ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක යා/එස්එන්ඩී/2012/06 හා 2012.02.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.2988ක් පමණ වන සූඩුවෙන්දපුලන් නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 1 – සූඩුවෙන්දපුලන් – ප්‍රමාණය: හෙක්. 0.2988ක් පමණ**
උතුරට: ටී. නාගලිංගම් සහ මන්ඩලීස්වරන්ගේ බිරිඳ කමලා හිමිකම් කියන සූඩුවෙන්දපුලන්; නැගෙනහිරට: මාර්ගය සහ එස්. සිවගුරුනාදන් සහ එන්. මීනම්පිකයි හිමිකම් කියන සූඩුවෙන්දපුලන්; දකුණට: එස්. සිවගුරුනාදන්, එන්. මීනම්පිකයි, පී. නඩරාජා සහ මහලිංගම්ගේ බිරිඳ මනොන්මනී හිමිකම් කියන සූඩුවෙන්දපුලන්; බටහිරට: මහලිංගම්ගේ බිරිඳ මනොන්මනී සහ මන්ඩලීස්වරන්ගේ බිරිඳ කමලා හිමිකම් කියන සූඩුවෙන්දපුලන්.

08 - 886

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.